**ලංකා ධීවර සංස්ථාව - 2017**

----------------------------------

ලංකා ධීවර සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2016 සහ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා 2018 ඔක්තෝබර් 18 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙන යාම**

---------------------------------------------------

සංස්ථාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත්, ලේඛන හා ලෙජර් ගිණුම් සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

----------------------------------

සංස්ථාව විසින් අවසන්වරට පිළියෙල කර විගණනය කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්,බැරකම්,ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වත්කම්** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| ජංගම නොවන වත්කම් | 1,713,458,355 |
| ජංගම වත්කම් | 449,150,463 |
| **මුළු වත්කම්** | **2,162,608,818** |

**බැරකම්**

**-----------**

| | |
|---|---|
| ජංගම බැරකම් | 864,474,891 |
| ජංගම නොවන බැරකම් | 205,984,946 |
| | 1,070,459,837 |
| ශුද්ධ වත්කම්/අයිතිය | 1,092,148,981 |
| **මුළු බැරකම්** | **2,162,608,818** |
| මුළු ආදායම් | 2,597,580,607 |
| මුළු වියදම් | 2,857,498,081 |
| **ඌනතාවය** | **(259,917,474)** |

**2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ණය ශේෂය රු.216,613,249 ක් වූ අතර මෙම ශේෂය තුළ වර්ෂ 02 ට වැඩි රු.30,442,205 ක් ද වර්ෂ 05 ට වැඩි රු.52,602,126 ක් ද වසර 10 ට වැඩි රු.13,912,440ක් ද විශ්ලේෂණය කළ නොහැකි ශේෂය රු.939,937 ක් ද විය.

(ආ) ධීවර සංස්ථාවේ ශීතාගාරයකින් බාහිර ආයතන හා පුද්ගලයින්ට අධි ශීතකරණ පහසුකම් සැපයීමේදී මත්ස්‍ය තොග භාරගැනීම හා නිකුත් කිරීම හා මුදල් අයකර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු රු.6,629,237 ක් වූ ශේෂය තුළ වසර 05 කට අධික කාලයක සිට රු. 3,358,995 ක්ද, වර්ෂ 01 ත් 05 ත් අතර ශේෂය රු. 3,261,535 ක් ද අයවිය යුතුව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ණයහිමි ශේෂය රු.217,387,304 ක් වූ අතර මෙම ශේෂය තුළ වසර 01 ත් 02 ත් අතර ශේෂය රු.2,881,212 ක් ද වසර 02 ට වැඩි ශේෂය රු.73,952,086 ක් ද විය.

**2.5 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

-------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල් ඉකුත් වූ පරිභෝජනයට නුසුදුසු මසුන් විකිණීම සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් නඩු 03 ක්ද, සංස්ථාවේ වාහන අනතුරු සම්බන්ධයෙන් රු. 9,500,000 ක වන්දි ඉල්ලා නඩු 05 ක්ද, සේවකයින් විසින් නැවත රැකියාව හා පසු වැටුප් වන්දි ඉල්ලා නඩු 08 ක් ද, සේවිකාවක් විසින් රු.මිලියන 5 ක වන්දි ඉල්ලා නඩුවක්ද මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් සංස්ථාවේ සේවකයින් නඩු 02 ක්ද, සංස්ථාවට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණ, දිසා අධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව රු.16,987,572 ක් අයකර ගැනීම සඳහා නඩු 09 ක් පවරා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 5.1 වගන්තිය අනුව රජයේ වාණිජ ව්‍යාපාරවල කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළයුතු බැවින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟාකර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවද, සංස්ථාවේ 2017 වර්ෂයේ සිට ඉදිරි කාලපරිච්ඡේද සඳහා වූ සංයුක්ත සැලැස්ම විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 12 දින දක්වාම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) යථෝක්ත චක්‍රලේඛයෙහි 5.2 වගන්තිය අනුව සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතු වුවත් සංස්ථාව විසින් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමෙන් තොරව 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. මේ හේතුවෙන් දීර්ඝ කාලීන අරමුණුවලට ළඟාවීමට හැකිවන අයුරින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබූ මෙගා වෙළඳසැල් ඉදිකිරීම, නව මසුන් අලෙවිකිරීමේ වෙළඳසැල් ඉදිකිරීම, කාගිල්ස්, කීල්ස් සහ ලාෆ් සුපිරි වෙළඳසැල් සමඟ වෙළඳ හවුල් ඇතිකර ගැනීම, නව ශීතාගාර සංකීර්ණ ඉදිකිරීම සහ ගබඩාකරණ පහසුකම් නවීකරණය කිරීම, HAACAP රෙගුලාසි වලට අනුව ඇසුරුම් අංශය ප්‍රතිසංවිධානය කිරීම, වායුහරණ ඇසුරුම් (Vaccum Pack) යන්ත්‍රයක් මිලදී ගැනීම,ව්‍යාපාරික කටයුතු පරිගණකගත කිරීම යන ක්‍රියාකාරකම් වලට අදාල සහ භෞතික කාර්යසාධනය විගණනයට ඉදිරිපත් නොවුනි.

**3.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

(අ) 1964 ඔක්තෝබර් 01 දිනැති අංක 14/186 දරණ සහ 2011 ජුනි 30 දිනැති අංක 1712/21 දරණ අති විශේෂ ගැසට් පත්‍ර මගින් නියම කරන ලද ව්‍යාපාරික කාර්යයන් අතුරින් පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට සංස්ථාව විසින් කටයුතුකර නොතිබුණි.

(i) සංස්ථාව විසින් සෘජුවම හෝ ඒජන්තවරුන් මාර්ගයෙන් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල නිරතවීම.

(ii) මත්ස්‍ය පිරිසැකසුම් කිරීම.

(iii) බලයලත් ඒජන්තවරු මාර්ගයෙන් මසුන් තොග සහ සිල්ලර වෙළඳාම් කිරීම.

(iv) මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම.

(v) විදේශීය වෙළඳපොළවල මසුන් විකිණීම.

(vi)

(ආ) ධීවර සංස්ථාව ස්ථාපිත කිරීමේ දී සංස්ථාව වෙත පැවරී තිබූ ධීවර වරායන් සහ නැංගුරම් පොළවල් ඉදිකිරීම සහ පවත්වාගෙන යාම, ධීවර ආම්පන්න ආනයනය කිරීම සහ විකිණීම, ධීවර යාත්‍රා ඉදිකිරීම, ධීවර යාත්‍රා සඳහා නඩත්තු පහසුකම් සැපයීම, ධීවරයන්ගේ ඉල්ලීම් අනුව අවශ්‍ය උපකරණ නිපදවා අලෙවිකිරීම යන ව්‍යාපාරික කාර්යයන් ධීවර අමාත්‍යාංශය යටතේ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, සීමාසහිත සී - නෝර් පදනම හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන ස්ථාපිත කිරීමත් සමග එම ආයතනවලට පැවරී තිබූ නමුත් ඒ අනුව සංස්ථාවේ ව්‍යාපාරික කර්තව්‍යයන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) කාර්ය සාධන වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ඉලක්ක ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2,211 ක් වැයකර මසුන් මෙට්‍රික් ටොන් 6,000 ක් මිලදීගැනීමට හා මසුන් මෙට්‍රික් ටොන් 6,000 ක් විකුණුම් කර රු.මිලියන 2,911 ක ආදායමක් ලැබීමට ඉලක්ක කර තිබුණි. එහෙත් ප්‍රගති වාර්තා අනුව, රු.මිලියන 1,621 ක් පමණක් වැයකර මසුන් මෙට්‍රික් ටොන් 4264 ක් පමණක් මිලදීගෙන තිබූ අතර මසුන් මෙට්‍රික් ටොන් 3,914 ක් පමණක් අලෙවිකර රු.මිලියන 2,059 ක ආදායමක් ලබාගෙන තිබුණි. ඒ අනුව, ඉලක්කගත මසුන් මිලදීගැනීමේ අවශ්‍යතාවයෙන් සියයට 35 ක් හා විකුණුම් ඉලක්කයෙන් සියයට 65 ක් ළඟාකරගැනීමට නොහැකි වී තිබුණි. ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අනුව 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 531,310 කින් මෙට්‍රික් ටොන් 3914 ක් හෙවත් සියයට 0.73 ක් පමණක් සංස්ථාව විසින් අලෙවිකර තිබුණි. ඒ හේතුවෙන් ආයතනයේ ප්‍රධාන අරමුණ වන සහනදායී මිළකට පාරිභෝගිකයාට මසුන් සැපයීම තුළින් එදිනෙදා පාරිභෝගිකයාගේ මසුන් අවශ්‍යතාවය සපුරාලීමේ කාර්යය සම්පූර්ණ කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ii) නව ශීතාගාර සංකීර්ණයක් ඉදිකිරීමට සහ ගබඩා පහසුකම් නවීකරණය කිරීම වෙනුවෙන් රු.මිලියන 350 ක් සහ සංස්ථාවෙහි ව්‍යාපාර කටයුතු පරිගණකගත කිරීම (ERP) සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 03 ක් ප්‍රතිපාදනය කර තිබුණද එම කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී මසුන් විකිණීම සඳහා කාගිල්ස් (Cargills), කීල්ස් සුපර්(Keels Super), ලාෆ් සුපර්(Laugh Super) සමඟ වෙළඳ හවුල් ඇතිකර ගැනීමට සැලසුම්කර තිබුණද කාගිල්ස් ආයතනය සමග පමණක් එක් වෙළඳ හවුලක් ඇතිකරගෙන තිබුණි.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී සෑම ක්‍රියාකාරකමක් වෙනුවෙන්ම අපේක්ෂිත ප්‍රතිඵලය, අයවැයගත ප්‍රතිපාදනය සහ කාර්ය සාධන මිනුම් ඉදිරිපත් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයේදී අයිස් කැට විකිණීමෙන් රු.මිලියන 45 ක ආදායමක් උපයා තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම කාර්යය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 7.4.2 වගන්තිය අනුව, වාර්ෂික කාර්යසාධනය ඇගයීම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කල යුතු වුවද, සංස්ථාවෙහි වාර්ෂික කාර්යසාධනය ඇගයීම් කිරීම සඳහා එවැනි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. මේ හේතුවෙන් සංස්ථාවෙහි කාර්ය සාධනය ඇගයීම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමුවී නොතිබුණි. ඒ හේතුවෙන් මසුන් අලෙවිය සිදුකරන විධායක 32 අතුරින් 2014 වර්ෂයේ විධායකයන් 28 ක් ද, 2015 වර්ෂයේ විධායකයන් 30 ක් ද 2016 වර්ෂයේ විධායකයන් 27 ක් ද අලාභ ලබා තිබුණු අතර , පිළිවෙලින් එම වර්ෂවල ලබා ඇති මුළු අලාභය

රු.180,538,573 ක්, රු.138,040,828 ක් හා රු. 68,184,221 ක් විය.අයිස් යන්ත්‍රාගාර 08 ම 2015 වර්ෂයේ රු. 33,364,965 ක හා 2016 වර්ෂයේ රු.17,581,153 ක අලාභ ලබා තිබූ අතර සංස්ථාව විසින් අලාභ අවමකර ගැනීමට සැලසුම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස්කර නොතිබුණි.

(ආ) සංස්ථාව ප්‍රතිව්‍යුහගත කර ලාභදායී වාණිජමය ව්‍යාපාරයක් බවට පත්කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල තීරණයන් මත ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර 2016 මාර්තු 18 දිනැති 02/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි 2016 මැයි 20 දින රු. 109,906,261 ක් වැය කර සේවකයන් 102 දෙනෙකු විශ්‍රාම ගන්වා තිබුණි. එහෙත් සංස්ථාව ලාභදායී වාණිජ ව්‍යාපාරයක් බවට පත්කිරීමේ අරමුණට ළඟාවීම සඳහා අනිකුත් සැලසුම් සකස් කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂ 06 ක කාලය තුළදී සංස්ථාවේ වෙළඳපොල කොටස සියයට 1.1 සිට 0.7 දක්වා අඩුවී තිබුණු අතර ඊට හේතු සොයා බලා වෙළඳපල කොටස වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් මත්ස්‍ය මිළ ස්ථායීකරණය කිරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම සහ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු පාරිභෝගික සේවාවන් පවත්වා ගැනීම යන අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව අවම වී තිබූ අතර එය සංස්ථාවේ පැවැත්මට අහිතකර ලෙස බලපෑම් ඇතිවී තිබුණි.

(ඈ) 2011 වර්ෂයේ සිදුවී තිබූ රු. 2,558,028 ක් වටිනා ඇසුරුම් තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු ගබඩා අංශයෙහි කළමනාකරුට විරුද්ධව පවත්වන ලද විනය පරීක්ෂණයේදී එම ඌනතාවය අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමට 2016 මාර්තු 09 වන දින තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි.

(ඉ) ලංකා ධීවර සංස්ථාවේ විනය නියෝග මාලාවේ “අ” උපලේඛනය යටතට ගැනෙන රාජකාරී පැහැර හැරීම හෝ විෂමාචාරයන්හි යෙදීම යන වරද යටතේ චෝදනා ලැබ තිබූ නිලධාරීන් තිදෙනෙකුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණ පවත්වා විනය ක්‍රියාමාර්ග ගෙන තිබූ නමුත් රෝහල් සඳහා මාළු සැපයීම වෙනුවෙන් අයකර ගත යුතු රු.මිලියන 13.9 ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) 2001 පෙබරවාරි මාසයේදී රු.192,000 ක මුදල් අක්‍රමිකතාවයක් ඇතුළු අක්‍රමිකතාවයන් 12 කට චෝදනා ලැබ වැඩ තහනමට ලක්ව සිටි සංස්ථාවේ සහකාර කළමනාකරුවෙකු විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව 2001 සැප්තැම්බර් 03 දින නැවත සේවයේ පිහිටුවා තිබූ අතර පුහුණු වැඩසටහනකට සහභාගී වීම සඳහා විදේශගතවීමටද අවස්ථාව ලබාදී තිබුණි. එම නිලධාරියා 2011 ඔක්තෝබර් 03 දින සිට II ශ්‍රේණියේ විධායක කළමනාකාර තනතුරටද 2011 ඔක්තෝබර් 20 දින සිට I ශ්‍රේණියේ විධායක කළමනාකාර තනතුරටද උසස් කර 2015 වර්ෂයේ සැප්තැම්බර් 21 දින සිට ප්‍රධාන කාර්යාලයේ ශීතාගාර කළමනාකරු ලෙස පත්කර තිබුණි. කෙසේ වුවද 2016 වර්ෂයේදී මෙම නිලධාරියා සේවයෙන් පහකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සංස්ථාව විසින් දිස්ත්‍රික්ක 08 ක භුක්ති විඳින අක්කර 12 .47 ක් වූ ඉඩම් 15 ක් , අදාල පාර්ශවයන් වෙතින් නීත්‍යානුකූලව පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ධීවර සංස්ථාවේ සභාපති අමතන ලද 2013 මාර්තු 06 දිනැති අංක එන්පීසී/1/2/6 දරන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික වැඩසටහන් උපදේශකගේ ලිපිය අනුව රු.මිලියන 15 ක් වූ ත්‍රිකුණාමලය මසුන් අලෙවිසැල 2013 මාර්තු 09 දින සිට සංස්ථාව වෙත පවරාගන්නා ලෙස දන්වා තිබුණද, විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් දක්වාම පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය අනුව වෙළඳ මත්ස්‍ය භෞතික තොගය පොත් අගය සමග සැසඳීමේදී කිලෝග්‍රෑම් 6940.64 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර එම ඌනතාවයට හේතු වූ කරුණු අනාවරණය කරගෙන අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2018 ඔක්තෝබර් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඒ) සංස්ථාවේ මෙහෙයුම් කළමනාකරු ලෙස කටයුතු කරන ලද නිලධාරියෙකු චෝදනා 11 කට වැරදිකරු වී වැඩ තහනම් කර තිබුණද, විධිමත් විනය පරීක්ෂණයකින් තොරව 2009 ජූලි 07 දින සිට නැවත සේවයේ පිහිටුවා විධායකයන් 06 ක කළමනාකාර ධූරය සඳහා පත්කර තිබුණි.

(ඔ) 2015 වර්ෂයේදී අභ්‍යන්තර විගණන වාර්තා 03 කින් පෙන්වා දී ඇති අලාභයන් හා අයකරගත යුතු ශේෂ පිළිවෙලින් රු.8,356,253 ක් හා රු.5,139,900 ක් වූ අතර අයකරගැනීමට හා අදාල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ඕ) 2010 ජනවාරි 20 දින සිට මාසිකව රු. 200,000 ක බදුකුලියකට වසර 2 ක් සඳහා පුද්ගලික ආයතනයකට බදු දී තිබූ සංස්ථාව සතු රු. 66,715,516 ක් වටිනා බහුදින ධීවර යාත්‍රා දෙකකට අදාලව , 2011 ජනවාරි සිට 2013 නොවැම්බර් දක්වා හිඟ බදු කුලිය රු.6,000,000 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරමින් පැවතුණි. ඉහත සඳහන් යාත්‍රා 2014 වර්ෂයේදී තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව තෝරාගත් එක් බදුකරුවෙකු වෙත නැවතත් බදු දී තිබුණි. තවද ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම බහුදින ධීවර යාත්‍රා බදු ගැණුම්කරු සතු කර තිබුණු අතර 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා යාත්‍රාවලට අදාල රු.1,125,000 ක බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂයේදී මෙම යාත්‍රා දෙක රු.5,626,500 කට විකුණා තිබූ අතර මේ හේතුවෙන් සංස්ථාව ස්ථාපිත කිරීමේ අරමුණක් වන සෘජුව මුහුදේ යාත්‍රා යොදා මසුන් ඇල්ලීමේ කටයුතු කිරීමේ අරමුණ ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

## 3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අතිරේක සේවක සංඛ්‍යාවක් පැවතීම, ඉහළ කළමනාකරණයේ තනතුරුවල සිටින නිලධාරීන් කෙටිකාලීනව වෙනස්වීම යන කාරණා හේතුකොටගෙන සංස්ථාවේ සැලසුම් නිරන්තරයෙන් වෙනස්වීම සහ කාරක ප්‍රාග්ධන අර්බුදයක් පැවතීම සංස්ථාව 2005 වර්ෂයේ සිට දිගින් දිගටම අලාභ ලැබීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මත්ස්‍ය අලෙවිසැල් 250 ක් ඉදිකිරීමේ ඉලක්කයක් සපුරාගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමකින් තොරව 2010 හා 2011 වර්ෂයන් තුලදී රාජ්‍ය බැංකුවකින් රු.මිලියන 100 ක ණය මුදලක් ලබාගෙන තිබූ අතර එම කාලපරිච්ඡේදය සඳහා රු.මිලියන 38.5 ක පොළියක් ගෙවීමටද සිදුවී තිබුණි. එහෙත්, 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 47.2 ක් වැයකර අලෙවිසැල් 91 ක් පමණක් ඉදිකර තිබූ අතර 2016 වර්ෂය වනවිට අලෙවිසැල් 172 ක් ඉදිකර තිබුණද ප්‍රමාණවත් මසුන් අලෙවියක් නොමැතිවීම හා පාරවල් පුළුල් වීම ආදී කරුණු හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වනවිට අලෙවිසැල් 75 ක් වසා දමා තිබුණි. තවද ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට පෙර ඉඩම් වල හිමිකම් ලබා නොගැනීම හේතුවෙන් ඇති වී තිබූ නීතිමය ගැටළු නිරවුල් කරගැනීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඇ) විදේශයන්ගෙන් මසුන් ආනයනය කිරීම සංස්ථාවෙහි ව්‍යාපාරික කාර්යයක් වුවත් සංස්ථාව විසින් සෘජුවම විදේශයන්ගෙන් මසුන් ආනයනය කිරීම වෙනුවට, ශ්‍රී ලංකාව තුළ සිටින මසුන් ආනයනය කිරීමේ ඒජන්තවරුන් හරහා සමාලෝචිත වර්ෂය තුලදී මසුන් මෙට්‍රික් ටොන් 535.091 ක් රු.309,090,621 කට මිලදී ගෙන තිබුණි. මේ හේතුවෙන් සංස්ථාවේ එක් අරමුණක් වන මසුන් හිඟ කාලවලදී විදේශයන්ගෙන් අඩු මිළට මසුන් ආනයනය කර වෙළඳපොළෙහි මිල පාලනය කිරීමට සංස්ථාවට නොහැකිවී තිබුණි.

(ඈ) සංස්ථාව විසින් මසුන් අලෙවි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නියෝජිතයන් මාර්ගයෙන් රටතුල සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මසුන් අලෙවිකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මත්ස්‍ය වෙළඳපොළෙහි මිල ස්ථායිකරණය කිරීමේ නියාමන ආයතනයක් ලෙස කටයුතු කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට මසුන් අලෙවි කිරීම සඳහා නියෝජිතයන් 10 දෙනෙකු සිටියද ක්‍රියාකාරී නියෝජිතයන් සංඛ්‍යාව 3 දෙනෙකු පමණක් විය. තවද, 2017 දෙසැම්බර් 31 දිනට අක්‍රිය නියෝජිතයන්ගෙන් අයවිය යුතු වර්ෂ 10 ට වඩා පැරණි රු.1,471,890 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතුකර නොතිබූ අතර ක්‍රියාකාරී නියෝජිතයන් තිදෙනාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.785,591 ක් ලැබිය යුතුව තිබුණි.

(iii) මසුන් අලෙවි කිරීමේදී ඒජන්තවරුන් මාර්ගයෙන් මසුන් අලෙවිකිරීම තුලින් පිරිවැය අඩුකර ගතහැකි වුවද සංස්ථාව විසින් පිරිවැය අධික ක්‍රමයක් වන නව වෙළඳසැල් ඉදිකර මසුන් විකිණීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකර තිබුණි. තවද, නව වෙළඳසැල් ඉදිකර වෙළඳසැල් සඳහා නව කාර්ය මණ්ඩල බඳවා ගැනීමට සිදුවීම හේතුවෙන් සංස්ථාවෙහි මෙහෙයුම් වියදම් තවදුරටත් ඉහළයන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) සංස්ථාව විසින් සෘජුවම හෝ ඒජන්තවරු මාර්ගයෙන් ගැඹුරු මුහුදේ ට්‍රෝලර් යාත්‍රා යොදා මසුන් ඇල්ලීම සංස්ථාව ස්ථාපිත කිරීමේ ව්‍යාපාරික කර්තව්‍යයක් වුවත් එසේ කටයුතු නොකිරීමත් මසුන් සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද වීමත් හේතුවෙන් අඩු මිලට මසුන් මිලදී ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

(v) සංස්ථාව සතුව අධි ශීතකරණ සහිත ලොරි රථ 50 ක් පැවති අතර ඉන් ලොරි රථ 46 කම ශීතකරණ පද්ධතිය ක්‍රියාවිරහිතව තිබියදී මසුන් අලෙවිය සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(vi) මිලදීගත් මසුන් තොග පොතට ඇතුළත් කිරීමේදී , තොග ලැබීම් පත්‍රිකාවල ගබඩා භාරකරු , ආරක්ෂක නිලධාරී, තත්ත්ව පාලක, සුපරීක්ෂක, ආහාර තාක්ෂණවේදී සහ බලය පවරන නිලධාරියා විසින් අත්සන් නොකර තොග පොතට ඇතුළත් කර තිබුණි. මේ හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට මසුන් කිලෝ 5542 ක් කරවල බවට පත්කල යුතු තත්ත්වයට පත්ව තිබූ අතර ඉන් සංස්ථාවට රු. 1,549,308 ක අලාභයක් වී තිබුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට මසුන් කිලෝ 3244 ක් කරවල තත්ත්වයට පත්වී තිබුණු අතර ඉන් රු.920,068 ක අලාභයක් සංස්ථාවට වී තිබුණි.

(vii) ශීතාගාරය තුල තෙත මසුන් ගබඩා කිරීමට පෙර එම මසුන් අධි ශීතාගාර (සෙල්සියස් අංශක -40) තුල ශීතකල යුතු වුවත් සංස්ථාව තුළ අධිශීතකරණ නොමැතිව 2017 වර්ෂයේ ඔක්තෝබර් සිට 2018 අගෝස්තු මාසය දක්වා තෙත මසුන් කිලෝ 74961 ක් මිලදීගෙන තිබුණි. අධිශීතකරණ නොමැතිව සාමාන්‍ය ශීතාගාර වල තෙත මසුන් ශීත කිරීමේදී දින 04 ත් 05 ත් අතර කාලයක් ගතවන

බවත් , මසුන්ගේ බර අඩුවීමට සහ මසුන් ඉක්මනින් නරක්වීමට හේතුවන බවත් විගණනයේදී අනාවරණය විය.

(viii) 2017 නොවැම්බර් 09 දින සංස්ථාවේ අභ්‍යන්තර විගණකවරයා විසින් නිකුත් කරන ලද අංක සීඑෆ්සී/ඒ/එස්- ඕපී/17- 16 දරන අභ්‍යන්තර විගණන වාර්තාව මගින් සංස්ථාවේ අභ්‍යන්තර විගණකවරයා ආනයනික තලපත් මසුන් පරීක්ෂා කිරීමේදී මසුන් කිලෝ 100 ක අයිස් කිලෝ 04 ක් පමණ අඩංගු බව වාර්තා කර තිබුණි. සංස්ථාව විසින් ආනයනික මසුන් මිලදීගැනීමේදී අයිස් බරද ඇතුළුව සැපයුම්කරුවන්ට මුදල් ගෙවා තිබූ බව නිරීක්ෂණය වූ අතර, මේ අනුව ආනයනික මසුන් කිලෝ 100 ක අයිස් කිලෝ 03 ක් අවම වශයෙන් අඩංගු වුවහොත් සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගත් මසුන් කිලෝ 535,091 ක් තුල දළ වශයෙන් අයිස් කිලෝ 16,052 ක් අඩංගුවන බව නිරීක්ෂණය විය. ඒ අනුව අයිස් බරෙහි දළ වටිනාකම රු.9,149,640 ක් බව නිරීක්ෂණය වූ අතර අයිස් සහිතව මසුන් මිලදී ගැනීමෙන් සංස්ථාවට රු.9,149,640 ක ඇස්තමේන්තුගත පාඩුවක් සිදුවී තිබූ නමුත් මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

## 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් අනුරාධපුර පිහිටි පැරණි අතුරු නිෂ්පාදන කම්හලක් , පොළොන්නරුව රත්නපුර පුත්තලම, වේලනි, සයින්දමරුදු, බේරුවල සහ හම්බන්තොට පිහිටි අයිස් යන්ත්‍රාගාර 07 ක් , නිල නිවාසයක්, කරවල වියලීමේ අංගනයක්, ත්‍රිකුණාමලය පිහිටි දැල් සැකසුම් මධ්‍යස්ථානයක්, මන්නාරම පිහිටි පැරණි කරවල වියලීමේ අංගනයක් සහ පේසාලෙයි ඉඩමේ පිහිටි අයිස් යන්ත්‍රාගාරය මඩකලපුව පිහිටි බහාලුම් ශීතාගාර කොටස් 03 ක් යාපනය කරෙයිපූර් ඉඩම සහ ශීතාගාර ගොඩනැගිල්ල,කුරුණෑගල පිහිටි ඉඩම සහ පැරණි සංචාරක බංගලාව ප්‍රයෝජනයට ගැනීමකින් තොරව වර්ෂ 02 ත් වර්ෂ 29 ත් අතර වූ කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සංස්ථාවට අයත් වාහන 20 ක් සංස්ථා පරිශ්‍රය තුල හා අදාල විධායක තුල නිෂ්කාර්යව පවතින බව අභ්‍යන්තර විගණන වාර්තාව අනුව නිරීක්ෂණය විය.

(ඇ) මෝදර ශීතාගාරයේ සම්පිණ්ඩන යන්ත්‍ර 07 ක්ද, ශීත කාමර 13 ක්ද, අධි ශීත කාමර 04 ක්ද, කන්ඩෙන්සර් 02 ක්ද, නිෂ්කාර්යව පැවතුණි.

## 3.5 වෙනත් ආයතනවලට මුදාහැර ඇති සංස්ථාවේ සම්පත්

---------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට අයත් නිලධාරීන් පස්දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන 4 ක් වෙත මුදාහැර තිබූ අතර නිලධාරීන් තිදෙනෙකු සඳහා වැටුප් හා වේතන ලෙස රු.1,662,930 ක් සංස්ථාවේ අරමුදලින් ගෙවා තිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය අනුව සංස්ථාවේ දෛනික ව්‍යාපාරික කටයුතු සිදුකර ගෙන යාමට අත්‍යාවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මානව සම්පත් සංවර්ධන හා පරිපාලන, කළමනාකරණ ප්‍රසම්පාදන, ගණකාධිකාරී, පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකාරී ඇතුළු තනතුරු 13 ක පුරප්පාඩු 17 ක් සහ කනිෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක පුරප්පාඩු 35 ක් පැවතුණි. මේ හේතුවෙන් සංස්ථාවේ පරිපාලන කටයුතු සහ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් සිදුවී තිබුණි.

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

සංස්ථාව සතුව නිලධාරීන් 16 දෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන අංශයක් පැවති නමුත් ප්‍රධාන අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණන වාර්තා අනුව මිල කමිටුවේ මිලට වඩා වැඩි මිලට මිලදීගැනීම් කිරීම, ව්‍යාජ නම් වලින් ණයට මිලදී ගැනීම්, මුදල් පොත් දෛනිකව යාවත්කාලීන නොකිරීම හා වෙළඳසැල් 17 කට අදාලව රු.7,846,780 ක් හිඟව පැවතීම හා අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම සහ මෙට්රෝ විධායකයේ රු.11,209,369 ක ණයහිමි ශේෂ හා රු.7,730,607 ක් වූ ණයගැති ශේෂ පැවතීම හා එම ශේෂ නිරවුල් නොකිරීම වැනි කරුණු පෙන්වා දී තිබූ නමුත් කළමනාකරණයේ අවධානය ඒ සඳහා යොමුවී නොතිබුණි.

### 4.2 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) 2006 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකරගත් බද්ධ ව්‍යාපාරයෙහි කටයුතු 2010 වර්ෂය වනවිට අකර්මන්‍ය වීම නිසා එහි ආයෝජනය කර ඇති ඉඩමේ අයිතිය නැවත ලබාගැනීම සහ රු.මිලියන 214.4 හිඟ ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කරන ලෙස පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබූ නමුත් එම නියෝග ප්‍රකාරව කටයුතු කර නොතිබුණි

.

(ආ) යුරෝපා සංගමය විසින් පනවා ඇති තහනම ඉවත් කරන තුරු ධීවරයන්ගේ අතිරික්ත මත්ස්‍ය අස්වනු මිලදීගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබූ ටූනා ව්‍යාපෘතියේ අපේක්ෂිත මිලගණන් වලින් බැහැරව එවකට සිටි උපසභාපතිගේ අනුමැතිය මත මසුන් තොග මිලදීගැනීම හා විකිණීම හේතුවෙන් සති 02 ක කාලයක් සඳහා රු.47,359,695 ක අලාභයක් සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය පරිදි ඇමතිතුමාගේ නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡා කිරීම, ටූනා ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීමෙට හේතු පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එස්පී/එස්ජී/එස්ඩීජී/17 දරන රාජ්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට ලංකා ධීවර සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් සංස්ථාව විසින් එම විෂය පථයට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද , ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ආදායම් පාලනය | - විධායකයන් විසින් කරන ලද මසුන් අලෙවිය වෙනුවෙන් ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම හා හිඟ ආදායම් වසර ගණනාවක සිට අයකරගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) අයවැය පාලනය | - අනුමත කරන ලද අයවැය විගණනයට ඉදිරිපත් නොකිරීම. |
| (ඇ) තොග පාලනය | - ප්‍රශස්ත තොග මට්ටම් තීරණය කර නොමැති වීම හා තොග නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති වීම. පාරිභෝජනයට නුසුදුසු තොග පැවතීම. |
| | - තත්ත්වයෙන් බාල තොග ගබඩා කර තිබීම. |
| | - සංස්ථාව සතු මසුන් වෙළඳපොළට නිකුත් කිරීමට නිසි ක්‍රමවේදයක් නොපැවතීම. |
| | - පරිභෝජනයට නුසුදුසු තත්ත්වයේ මසුන් හොඳ තත්ත්වයේ මසුන් සමඟ ගබඩාකර තිබීම. |
| (ඈ) වත්කම් උපයෝජනය | - බාහිර පාර්ශවයන් සතු මසුන්, නිසි පරිදි අධිශීත නොවීම තුළින් ඒවා නැවත අධිශීත කිරීම වෙනුවෙන් අමතර විදුලි පිරිවැයක් දැරීමට සිදුවීම. |
| | - ශීතාගාර වෙත මසුන් ගබඩා කිරීමේදී තත්ත්ව පාලන නිලධාරීන් විසින් ගබඩාවට ලැබෙන මසුන් තොග හොඳ තත්ත්වයේ පවතින බව සහතික කර නොමැති වීම. |